# ග්‍රන්ථ විචාරය

**හැඳින්වීම**

ආචාර්ය ශාන්තිකුමාර් හෙට්ටිආරච්චි විසින් රචිත ***Faithing The Native Soil: dilemmas and aspirations of post-colonial Buddhists and Christians in Sri Lanka***, නමැති කෘතිය, ලාංකේය සන්දර්භය තුළ ආගමික, සමාජ හා දේශපාලනිකව වැදගත් වන කාලීන තේමා කිපයක් පාඨකයන්ට ඉදිරිපත් කරයි. මෙම කෘතිය එළි දක්වා ඇත්තේ ලාංකේය ඉතිහාසය පුරා වරින් වර මතුවුන බෞද්ධ - කිතුනු අර්බුදය නැවතත් කරළියට පැමිණ තිබෙන වකවානුවකය. ***ස්වදේශගතවන ඇදහිල්ල : ලාංකේය පශ්චාත් යටත් විජිත සමයේ බොදුනු-කිතුනු උභතෝකෝටිකයන් සහ අපේක්ෂාවන්,*** මෙම කෘතියෙන් විචාරාත්මකව විග්‍රහ කරන්නේ දෙදහස් පන්සිය වසරකට වඩා ඉපැරණි බෞද්ධාගමත්, වසර පන්සියයක් පමණ පැරණි කිතුනු ආගමත් අතර සබැඳියාව කේන්ද්‍රීය තේමාව ලෙස විමර්ශනයට ලක් කරමින්ය.

ක්‍රි.ව. 05වන සියවසේ සිට මෙරට කිතුනු ආගම පැවති බවට වන කිතුනු ඉතිහාසඥයන්ගේ මත, කතුවරයාගේ විමර්ශනයට ලක් වූව ද ඒවාහි ඓතිහාසික බවට ප්‍රතිවිරුද්ධව ඉදිරිපත් කොට තිබෙන නොකිතුනු ඉතිහාසඥයන්ගේ මත

විචාරයට ලක් නොවීම මෙම කෘතියේ දක්නට ලැබෙන අඩුවකි. (පිටු 138).

ලක් පොළොව මත ක්‍රිස්තියානිය ශක්තිමත්ව මුල් අදින්නේ යටත්විජිතවාදයේ (colonialism) සමාජ, ආර්ථික, හා දේශපාලනික බලයට සමගාමීව යන මතය කතුවරයා ගැඹුරින් විග්‍රහයට ලක් කරයි. පෘතුගීසි අධිරාජ්‍යවාදීන් යටතේ කතෝලික ආගමත් (Catholicism - 1505), ලන්දේසි අධිරාජ්‍යවාදීන් යටතේ රෙපරමාදු කැල්විනිස්ත ක්‍රිස්තියානියත් (Calvinism - 1638), බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් සමස්ත රටම ආක්‍රමණය කොට ඇන්ග්ලිකන් ක්‍රිස්තියානියත් (Anglicanism - 1815) ලක් දෙරණේ ස්ථාපිත කළේ මනා සැලැස්මකින් යුතුව, හින්දු සහ බෞද්ධ ආගමික ස්වදේශිකයන්ව ක්‍රිස්තියානිකරණය (Christianization) කිරීමෙන් බව කතුවරයා විචාරයට යොමු කරන්නේ ක්‍රිස්තියානි ධර්මදූතවේදය (Missiology) සහ ධර්මදානය (Evangelization) යන තේමාවන් පදනම් කර ගනිමින්ය. (පිටු 139-143).

එමෙන්ම පූර්ව නිදහස් යුගයේ ක්‍රිස්තියානි ධර්මදූතවේදයත්, පශ්චාත් නිදහස් යුගයේ නව ධර්මදානීය සභාවන්ගේ (New Evangelical Churches) එවැන්ජලිකවාදයත් (Evangelicalism), මෙරට බොදුනු - කිතුනු සහජීවනයට කරන ඉමහත් බලපෑම කතුවරයා විග්‍රහ කරන්නේ අතීතයත් වර්තමානයත් සංසන්දනාත්මකව දකිමින්, ඉතිහාසය නැවත විකාශය වන ආකාරය (re-visiting history) විචාරශීලීව පෙන්වා දෙමින්ය. එනම් නිදහසට පෙර ආරම්භ වූ බෞද්ධ පුනරුදයට නායකත්වය දුන් මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, පරමවිඥානාර්ථවාදී හෙන්රි ස්ටීල් ඕල්කට්, සහ අනගාරික ධර්මපාල මෙන්ම නිදහසින් පසු යුගයේ බෞද්ධ පුනරුදයට නැවත පණ දුන් 56 පංච මහා බලවේගයත්, 2004 වසරේ සිදුවූ සෝම හිමිගේ මතභේදාත්මක මරණයත් සමඟ යළි පිබිදුන බෞද්ධ අනන්‍යතාව, හෙළ උරුමය නම් වූ දේශපාලන පක්ෂයේ පාර්ලිමේන්තු භික්ෂු දේශපාලනය

ඇසුරෙන් බිහිවූ අකාරය කතුවරයා විසින් විචාරාත්මකව පෙන්වා දෙනු ලැබේ. (පිටු 7, 24-41, 179-185).

## ප්‍රධාන ප්‍රස්තුතය

කතුවරයාගේ ප්‍රධාන ප්‍රස්තුතය (Thesis) වන්නේ නිදහසින් පසු යුගයේ ලාංකේය ක්‍රිස්තියානි සභාවන්ගේ ධර්මදූතවේදයේ සහ ධර්මදානයේ මූලික අරමුණ කුමක් ද යන්න පර්යේෂණයට යොමු කිරීමයි. තුන්වන සහ හතරවන පරිච්ජේද මගින් උක්ත ප්‍රස්තුතය ඔහු විමර්ශනයට භාජනය කොට තිබේ. තුන්වන පරිච්ජේදයේ තේමාව වන්නේ **රෝමානු කතෝලික සභාවේ ධර්මදූතවරය** (Mission) **සහ ප්‍රයුක්තිය** (Praxis) යන්නයි. අනෙකුත් ප්‍රොතෙස්තන්ත සභා සමඟ සසඳන විට, ධර්මදූතවේදය පිළිබඳ රෝමානු කතෝලික සභා ස්ථාවරයේ වෙනසක් ඇතිවන්නේ දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් පසුකාලීනවය. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මගින් නිකුත් කළ සමහර ලේඛන වෙනත් කිතුනු සභාවන් අතර සාමයික සංවාදයට මුලපුරමින්, ජගත් ක්‍රිස්තියානි ප්‍රගමනයට (Ecumenical Movement) දායක වූ හෙයින් එම මන්ත්‍රණ සභාව ඊට පෙර පැවති අන් සියලු මන්ත්‍රණ සභාවලට වඩා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ජගත් මන්ත්‍රණ සභාවක් වූ බව විද්වත් මතයයි. කතුවරයා පෙන්වාදෙන ආකාරයට සභාව පිළිබඳ ලේඛනයේ (*Lumen Gentium*) **කිතුනු සභාව යනු දේව ජනතාව** යන නිර්වචනය ශුද්ධ ලියවිලි මූලාශ්‍ර මත පදනම් වෙමින් ඉදිරිපත් කළ රැඩිකල් (Latin - rādīx - going to the root) නිර්වචනයකි. **කොන්ස්ටන්ටයින් ක්‍රිස්තියානිය** ආරම්භයේ (ක්‍රි.ව. 313 හා 324) සිට රෝම සභාව මුල් තැන දුන් පූජකවාදය (Clericalism), ජයග්‍රාහක සභාව (Triumphant Church), විධිගරුකත්වය (Juridicism), මෙන්ම රාජකීය සභාව (Monarchal Church), යන නිර්වචන සහා අර්ථ නිරූපණයෙන් ඉවත් වී සමස්ත ජනතාව

දේව ජනතාව හා සුසිත් ජනයා ලෙස හැඳින්වීමෙන් එතෙක් පැවති සභා ව්‍යුහ ධූරාවලිය (hierarchical structure) ඉන් ප්‍රතික්ෂේප විය.

## දෙවන වතිකාන සභාවේ විසංවාදය

මෙම කෘතියේ විශේෂත්වය වන්නේ දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ එක් ලේඛනයකින් ඉස්මතු කරන ප්‍රගතිශීලී ධර්මදූතවේදී චින්තනය (Mission Thinking) වෙනත් ලියවිල්ලකින් ප්‍රතිවිරෝධී තත්ත්වයකට පත්කරන ආකාරය සංසන්දනාත්මකව පෙන්වා දීමයි. **කිතුනු සභාව යනු දේව ජනතාව** යන නිර්වචනයට පරස්පරවිරෝධී ලෙස එම මන්ත්‍රණ සභාවෙන්ම ප්‍රකාශිත **සභාවේ ධර්මදූත ක්‍රියාවලිය** හෙවත් ***Ad Gentes*** ලේඛනයේ 12වන වගන්තිය මෙහි දී කතුවරයා විචාරාත්මකව විමසා තිබේ. එම වගන්තියට අනුව සභා ධර්මදූතවේදයේ අරමුණ වන්නේ සියලු ජනතාවගේ ගැලවීම උදෙසා බෞතිස්මය හා ශුභාරංචිය ප්‍රකාශ කිරීමත් එම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා සභාවන් රෝපණය (Implanting Churches) කළ යුතු බවත් ය. (පිටු 60-61). මේ අනුව බලන විට නව ධර්මදානීය සභාවන්ගේ (New Evangelical Churches) එවැන්ජලිකවාදයත් (Evangelicalism), මීට සමාන වේ. කතුවරයා උපුටා දක්වා තිබෙන මහාචාර්ය සසංක පෙරේරාගේ පර්යේෂණයට අනුව, අරමුණු වශයෙන් ගත් කළ මෙම සමාන බව හඳුනාගත හැකිය. [Sasanka Perera, "New Evangelical Movements and Conflict in South Asia: Sri Lanka and Nepal in Perspective, 1998, 109].

කිතුනු නොවන ආගම් (Non-Christian religions) පිළිබඳ ලියැවුන Nostra Aetate ලේඛනය, සභා ඉතිහාසයේ ප්‍රථම වතාවට අන් ආගම් ගැන සුබවාදී දැක්මක් ප්‍රකාශ කළේ එම

**ආගම්වල තිබෙන සත්‍ය හා ශුද්ධ වූ කිසිවක් ප්‍රතික්ෂේප නොකරන** බව සටහන් කරමින්ය. තව ද මෙම ලේඛනය, සභාව විසින් මෙතෙක් අන් ආගම් ඇමතූ මිථ්‍යාදෘෂ්ටික (pagan) වැනි වචන භාවිතයෙන් වැළකීම සර්වශුභවාදී දැක්මකි. එමෙන්ම **ආගමට හැරවීම** හෙවත් සංවර්තනය (conversion) යන වචනය ද යොදා නොගැනීම විශේෂත්වයකි. දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් පසු 6වන පාවුළු පාප් තුමා විසින් 1964 දී කිතුනු නොවන ආගම් සමඟ වන සංවාදය වඩා විධිමත්ව කිරීමට ආයතනයක් පිහිටුවනු ලැබීමත් (The Secretariat for the Non-Christian Religions), එය අන්තර් ආගමික සංවාදය සඳහා වන පාප් තුමන්ගේ කොමිසම (The Pontifical Commission for Inter-religious Dialogue) ලෙස නැවත නම් කිරීමත් මගින් කතෝලික සභාව අන් ආගම් සමඟ වන සංවාදයට මුල් තැනක් ලබා දී තිබෙන බව කතුවරයා දක්වයි. කෙසේ වෙතත් 6වන පාවුළු පාප් තුමා විසින් 1974 දී නිකුත් කරන ලද *Evangeli Nuntiandi* ලේඛනයෙන් ශුභාරංචිය පතළ කිරීම සභාවේ ප්‍රධාන අරමුණ ලෙස ප්‍රකාශ කිරීම හේතු කොට ගෙන අන් ආගම් සමඟ වන සංවාදය වෙනුවෙන් දෙවන වතිකාන මන්ත්‍රණ සභාව ගත් රැඩිකල් පියවර අවතක්සේරු වන බව විද්වත් මත ඇසුරින් කතුවරයා විග්‍රහ කරයි. (පිටු 68-69).

**අන්තර් ආගමික සංවාදය සඳහා වන පාප් තුමන්ගේ කොමිසම සහ ජනතාවන්ගේ ධර්මදානීය සමූහනය (The Congregation for Evangelization of Peoples)** එකට එක්ව 1991 දී නිකුත් කළ **සංවාදය හා ප්‍රකාශනය (Dialogue and Proclamation)** නමැති ලියවිල්ල පිළිබඳ විද්වත් මත කතුවරයාගේ විචාරයට භාජනය වේ. (පිටු 86-89). එම ලියවිල්ලට අනුව අන් ආගම් සමඟ වන **සංවාදය** සහ **ශුභාරංචි ප්‍රකාශනය** සභා ධර්මදූතවරයේ අනුකල හා අවශ්‍ය (integral and necessary) කොටසක් ලෙස දක්වා තිබේ. එහිදී **සංවාදය, ශුභාරංචි**

ප්‍රකාශනයට වඩා උපසේවී හෙවත් දෙවැනි වන්නේ ද (sub-ordinate) යන්න කතුවරයා ප්‍රශ්න කරන්නේ මෙම ක්‍රියාකාරකම් දෙක අතර ආතතියක් (tension) තිබෙන බව පවසමින්ය. (පිටුව 87). තවද **ජනතාවන්ගේ ධර්මදානීය සමූහනයේ (The Congregation for Evangelisation of Peoples)** ලේකම් වූ කාදිනල් ජෝසෙෆ් ටොම්කෝගේ (Josef Tomko) අභාසය මෙයට හේතු වන්නට ඇතැයි කතුවරයා අනුමාන කරයි. (පිටුව 306). ක්‍රිස්තියානියට දෙදහස් වසරක් සපිරෙන අවස්ථාවේ එම ජුබිලිය සැමරීමට මෙරටට පැමිණි මෙම කාදිනල්වරයා **ශුභාරංචි ප්‍රකාශනයේ** අවශ්‍යතාව ඉස්මතු කළ ආකාරය දෙස බලන විට සංවාදයට හිමි වන්නේ දෙවන තැන බව පැහැදිළි වේ.

**දේවධර්මාචාර්යවරු හා ධර්මදූතවේදය (Theologians and Missiology)** යන අනු මාතෘකාවෙන් ද කතුවරයා තවදුරටත් පෙන්වා දෙන්නේ මිනිස් සංහතියේ ගැලවීම, ක්‍රිස්තුන් වහන්සේ සහ ක්‍රිස්තියානිය මත කේන්ද්‍ර වන්නේය යන මතය ඉස්මතු කරන න්‍යායන් කීපයකි. (පිටු 75-84).

දෙවන ජුවාම් පාවුළු පාප් තුමාගේ විශ්ව ලේඛන තුනක් [*Redemptor Hominis*, (1979), *Domiunm et Vivificantem*, (1986), *Redemptoris Missio*, (1990)] මෙන්ම 16වන බෙනඩික්ඩ් පාප් තුමාගේ ලේඛනයක් [Dominus Iesus, (2000)] ද ඇසුරින් ඔවුන්ගේ ධර්මදූත දේවධර්ම චින්තනය ඇගයීමකට ලක්කරන කතුවරයා සැබෑ අන්තර් ආගමික සංවාදයකට එම ලේඛනවල අන්තර්ගතය බාධාවන්නේ කෙසේ ද යන්න විද්වත් මත ඇසුරින් පෙන්වා දී තිබේ (පිටු 84-93).

## ප්‍රොතෙස්තන්ත ධර්මදූතවේදය

ප්‍රොතෙස්තන්ත සභාවන්ගේ ධර්මදූතවේදය පිළිබඳ දීර්ඝ විග්‍රහයක (Edinburg 1910, Post Edinburg in 1921 - New

York, 1923 - Oxford, Tambaram 1938, Lausanne Conference 1974) යෙදෙන කතුවරයා එහි ප්‍රතිඵලයක් ලෙස ආරම්භ වූ ජගත් සභා සමුළු (World Council of Churches) ප්‍රගමනය සමාජ, ආර්ථික, හා දේශපාලනික අර්බුද කේන්ද්‍ර කර ගනිමින් සභා ධර්මදූතවේදය චින්තනමය වශයෙන් පෝෂණය කළ ආකාරය විස්තර කරයි. (94-108).

එලෙසම විමුක්ති දේවධර්මය හා ආසියාතික දේවධර්මය පදනම් කරගනිමින් තුන්වන ලෝකයේ දේවධර්මාචාර්යවරුන්ගේ සාමයික සංගමය **(Ecumenical Association of Third World Theologians - EATWOT)** බිහිවීමත් සමඟ (පිටු 119-126), ලාංකේය දේවධර්මාචාර්වරුන් සාමයික සංවාදය ශක්තිමත් කිරීමට දායක වූ ආකාරය, මූලිකවම තිස්ස බාලසූරිය (නි.ම.නි.) සහ ඇලෝසියස් පීරිස් (ජේ.නි.) කේන්ද්‍ර කර ගනිමින් පස්වන පරිච්ඡේදයේ විග්‍රහයට ලක්කිරීම, මේ පිළිබඳ අධ්‍යයනයේ යෙදෙන විද්‍යාර්ථීන්ට ඉතා වැදගත් වේ. (137-148).

## සැබෑ අන්තර් ආගමික සංවාදයක්

අන්තර් ආගමික සංවාදයේ දී ආසියාතික සන්දර්භයේ සුවිශේෂී බව ලාංකේය දේවධර්මාචාර්යවරුන් පෙන්වා දෙන්නේ ආසියාතික ආගම්වල විමුක්ති හරය පදනම් කර ගනිමින් සංවාදය ඇරඹීමේ වැදගත්කම ඉස්මතු කිරීමෙනි. එම කර්තව්‍යයේ දී එක් ආගමකින් තවත් ආගමකට සංවර්තනය වීමට කිසිදු ඉඩක් නොමැත. කිතුනු ධර්මචින්තනය පදනම් වන්නේ සභාවේ වර්ධනය මත නොව දේව රාජ්‍යයේ වටිනාකම් අන් ආගමික ධර්ම චින්තන සමඟ සුසංවාදීව සංවාදයට ලක් කොට වඩා යහපත් ලෝකයක් බිහි කිරීමට දායක වීමෙනි. මෙහිදී මෙරට කිතුනු ආගම් තමන්ගේ යටත්විජිතවාදී මානසිකත්වයේ හැව ඉවත දැමිය යුතුය. ආසියාතික දිළින්දන්ගේ සමාජ, ආර්ථික, සංස්කෘතික, හා දේශපාලනික විමුක්තිය වෙනුවෙන් සැම

ආසියාතික ආගමකටම එම ආගමික ප්‍රාරම්භකයන් විසින් ලබා දෙනු ලැබ තිබෙන මුල් දූත මෙහෙවර නිවැරදිව සාක්ෂාත් කර ගත යුතුය. කතෝලික සභාව ප්‍රමුඛ අන් කිතුනු සභාවන් තමන්ගේ ධර්මදූතවේදය මෙම චින්තනය මත පදනම් කර ගන්නේ නම් සැබෑ අන්තර් ආගමික සංවාදයක් දියත් කළ හැකි බව කතුවරයා මෙම කෘතියෙන් පෙන්වා දෙයි. මෙම චින්තනය මත පිහිටා බුත්තල ග්‍රාමය කේන්ද්‍රකර ගනිමින් බොදුනු-කිතුනු සංවාදයක් ආරම්භ කළ මයිකල් රුද්‍රිගේ පියතුමාගේ අන්තර් ආගමික සබැඳියාව පිළිබඳ (පිටුව 131) කතුවරයා ගැඹුරු අධ්‍යයනයක යෙදුනේ නම් මෙම කෘතියේ අන්තර්ගතය වඩාත් අර්ථවත් වන්නට ඉඩ තිබිණ.

## දේශානුරූපීකරණය

ලාංකේය ක්‍රිස්තියානියේ අධිරාජ්‍ය ගැති යුරෝපීය අනන්‍යතාව ඉවත් කිරීමට පළමු පියවර තැබුවේ මෙරට ප්‍රොතෙස්තන්ත සභාවන්ය. ආසියාතික දේවධර්මාචාර්යවරයෙක් වූ මෙතෝදිස්ත සභාවේ ඩී. ටී. නයිල්ස් මෙහි පුරෝගාමියෙකි. **ශුභාරංචියේ විදේශීය පැළය එය සිටවා තිබෙන මල් පෝච්චියෙන් ඉවත් කොට එය දේශීය පොළවේ රෝපණය කළ යුතු බව (removing the foreign plant of the Gospel from its pot and transplanting it in the local soil)** ඔහුගේ සුප්‍රසිද්ධ ප්‍රකාශයකි. 1940 වකවානුවේදී ඔහු කළ මෙම ප්‍රකාශය අනුව යමින් මෙරට ප්‍රොතෙස්තන්ත සභාවන් ලාංකේය සංස්කෘතිකාංග උතුරු හා දකුණු ප්‍රදේශයේ ක්‍රිස්තියානි දේවස්ථාන ගොඩනැගීමේදී යොදා ගත් ආකාරය පිළිබඳ කතුවරයා සවිස්තරාත්මකව ඉදිරිපත් කොට තිබේ. (පිටු 221-225, 348 - **The indigenization of Christianity and return to Buddhism).**

දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මෙය **දේශානුරූපීකරණය (Inculturation)** ලෙස හැඳින්වීය. සිංහල කතෝලිකයන්, විශේෂයෙන්ම සිංහල භාෂාවේ උන්නතිය වෙනුවෙන් කැපවූ සිංහල කතෝලික ගුරුවරු මුනිදාස කුමාරතුංගයන්ගේ හෙළ හවුල සමඟ එක්වී තම ලාංකේය අනන්‍යතාව ප්‍රකාශ කළේ ජුසේ වාස් සහ ජාකොමේ ගොන්සාල්වෙස් වැනි ඔරතෝරියාන පූජක පෙරගමන්කරුන්ගේ දේශීය සංස්කෘතික දායාදය උරුම කර ගනිමින්ය. 1956 පංච මහා බලවේගයට (සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු) එක්වෙමින් ගුරුවරුන්ගේ බලය නියෝජනය කිරීමට මෙම සිංහල කතෝලික ගුරුවරුන්ට හැකි වූයේ ඔවුන් **මෙරට රෝමානු කතෝලික සභාවේ** අධිරාජ්‍ය ගැති යුරෝපීය හැව ඉවත දැමූ නිසාය.

## ධර්මදූතවේදයේ පාරාවළල්ල හෙවත් Missiological Blowback

තුඹසින් මතුවන වේයෝ මෙන් දින දින වැඩි වර්ධනය වන නව ධර්මදානීය සභාවන්ගේ බලපෑම මෙරට කතෝලික හා කිතුනු ස්ථාපිත සභාවන්ට ඉමහත් අභියෝගයක් වීම කතුවරයා නවතම සංකල්පයකින් විස්තර කරයි. එය **ධර්මදූතවේදයේ පාරාවළල්ල** හෙවත් **Missiological Blowback** ලෙස ඔහු හඳුන්වයි. (පිටු 225-228, 349, 350). විශේෂයෙන්ම මෙරට කතෝලික සභාවේ නිල ස්වභාවය හා නිද්‍රශීලී ධර්මදූතවේදය, නව ධර්මදානීය සභාවන්ට සාරවත් **මිදි උයනක්** සපයා දී තිබේ. **කිතු දන පුබුදුව** බිහි නොවන්නට මෙම ධර්මදානීය සභාවන් මෙරට කතෝලික සභා මිදි උයනේ පූර්ණ හිමිකරුවන් වන්නට ද ඉඩ තිබිණි. කතුවරයා ඉතා නිවැරදිව පෙන්වා දෙන පරිදි මෙරට නිල කතෝලික සභාව තම ඉතිහාසයේ ප්‍රථම වතාවට **ජාතික ක්‍රිස්තියානි සභාවත් (National Christian Council)** සමඟ එකමුතුව ප්‍රකාශයක් නිකුත් කිරීමට තීරණය කළේ ආගමට

**හරවා ගැනීමට විරුද්ධව වූ පනත,** හෙළ උරුමය නම් වූ භික්ෂු දේශපාලන පක්ෂය විසින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ගත් උත්සාහයේදීය. එය මෙරට ස්ථාපිත වූ කිතුනු සභාවන් මුහුණදෙන **ධර්මදූතවේදයේ පාරාවළල්ලට** දිය හැකි එක් නිදසුනකි. (පිටුව 227).

නව ධර්මදානීය සභාවන්ගේ වර්ධනය මගින්, නිදහසින් පසු මෙරට බෞද්ධ පුනරුදයේ තුන්වන පිබිදීමට මඟ හෙළි කර තිබෙන්නේ භික්ෂුන්ගේ පක්ෂ දේශපාලනය තහවුරු කරමින් සහ සිංහල බෞද්ධයන් ප්‍රබල බල කණ්ඩායමක් (pressure group) ලෙස ශක්තිමත් කරමින්ය. මෙම බල කණ්ඩායම් කතෝලික, ක්‍රිස්තියානි, හා නව ධර්මදානීය සභා සියල්ලම දකින්නේ මෙරට සිංහල බෞද්ධයන්ගේ අනන්‍යතාව නැති කිරීමට ක්‍රියා කරන පිරිසක් ලෙසය. මෙම කණ්ඩායම් විසින්ම ඔවුන්ව හඳුන්වාදී ඇති පරිදී අද වන විට ඔවුන් ක්‍රියා කරන්නේ මෙරට නිල නොවන පොලීසියක් ලෙසය. මෙහිදී යුරෝපීය හැව ඉවත් කොට තම දේශීය අනන්‍යතාව සොයමින් මෙරට සංස්කෘතිකාංග තම දේවස්ථානවලට ආරෝපණය කර ගත් කතෝලික හා ක්‍රිස්තියානි සභාවන් අද වන විට **ධර්මදූතවේදයේ පාරාවළල්ලට** ලක්ව තිබේ. ලාංකේය සංස්කෘතිකාංග සිංහල බෞද්ධයන්ට පමණක් උරුම වූවක් ලෙස මෙම ප්‍රබල බල කණ්ඩායම් පිළිගන්නාබව කතෝලිකයන්ට මැනවින් අවබෝධ වූයේ කළුතර ප්‍රදේශයේ එක් දේවස්ථානයක සඳකඩ පහණ ඉවත් කිරීමත් අනෙක් දේවස්ථානයේ සඳකඩ පහණ ඉවත් කිරීමට බලකිරීමත් යන සිද්ධීන් සමඟය. දේශානුරූපීකරණය වැළඳගත් කිතුනුවාට එය පාරාවළල්ලක් වන ආකාරය ඉන් පෙන්නුම් කරයි. මෙම සිද්ධිය මගින් බෞද්ධ බලපෑම් කණ්ඩායම් කිතුනුවන්ට පවසන්නේ කුමක්ද? මෙරට සමහර කිතුනුවෝ යුරෝපීය හැව ඉවත දමා දේශීය සංස්කෘතිය වැළඳගත්තද පරගැතියා පරගැතියාම වන බව නොවේද?

## ශුභාරංචියේ විසංවාදය

කතෝලික හා ක්‍රිස්තියානි ධර්මදූතවරු තමන් උපන් රටවල් අතහැර දමා මෙතරම් කැපවීමකින් යුතුව කටයුතු කළේ හා කරන්නේ ඇයි? මෙවන් පරාර්ථකාමී කැපකිරීමකට ඔවුන්ව මෙහෙයවන්නේ ශුභාරංචියේ අඩංගු ඉල්ලීමක් හේතු කොට ගෙනය. එනම් ජේසුතුමා විසින් තම ශ්‍රාවකයන්ට කරන ලද ධර්මදූත බලය පැවරීමයි (Missionary Mandate). **"එබැවින් ඔබ ගොස්, සකල ජාතීන් ගෝලයන් කරන්න. පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද නාමයෙන් ඔවුන් බව්තීස්ම ස්නාපනය කරන්න."** (මතෙව් 28:19).

එලෙසම කිතුනු ධර්මදූතවේදය හා ධර්මදානයට නිවැරදි ගමන් මඟ පෙන්වා දෙන්නේ එම ධර්මයේ ප්‍රාරම්භකයා වූ නාසරතයේ ජේසුස්ය. එතුමන්ට අනුව විය යුත්තේ මෙයයි. **"විනයධරයෙනි, පරිසිවරුනි, කෛරාටිකයෙනි. ඔබට වන විපතක මහත්! මන්ද එක්කෙනෙක් ආගමට හරවා ගන්න පිණිස ඔබ මුහුදෙන් හා ගොඩින් හැම තැන ම ගමන් කරන්නහු ය. එසේ හරවා ගත් පසු ඔහු ඔබ මෙන් තව දෙගුණයක් නිරාදූකට සුදුස්සෙකු කරන්නහු ය."** (මතෙව් 23:15).

ධර්මදූතවරය හා ධර්මදානය පිළිබඳ එකම ශුභාරංචියේ පවතින විසංවාදී බව මින් පෙන්නුම් කරයි. ධර්මදූතවරය හා ධර්මදානය හා සම්බන්ධව ගත් කළ මතෙව් ශුභාරංචියේ සඳහන් මෙම පාඨ දෙකෙන්, කිතුනුවෝ අනුසාර කළ යුත්තේ කුමක් ද? ආචාර්ය ශාන්තිකුමාර් හෙට්ටිආරච්චි විසින් රචනා කරන ලද, ***Faithing The Native Soil: dilemmas and aspirations of post-colonial Buddhists and Christians in Sri Lanka,*** නමැති කෘතිය, මෙහිදී අපට වැදගත් වන්නේ මෙම උභතෝකෝටිකය **(dilemma),** ඔහු ලාංකේය සමාජ, ආගමික හා දේශපාලනික සන්දර්භයට අනුව, මධ්‍යම ප්‍රතිපදාව මත පිහිටා, පර්යේෂණාත්මකව විමර්ශනයේ යෙදෙන බැවින්ය.

ලාංකේය කිතුනු ධර්මදූතවරය හා ධර්මදානය මූලික ප්‍රස්තුතය ලෙස විමර්ශනය කරන මෙම කෘතිය සෑම පුද්ගලයෙක්ම තමන්ගේ ආගමට ගරු කරන්නා සේ අනෙකාගේ ආගමට ද ගරු කළ යුතු බව පවසන්නේ **ස්ව (self)** හෙවත් **කිතුනු මම මෙරට බෞද්ධ හා හින්දු අනෙකාව (the other)** ආගමට හරවා ගැනීම සඳහා මෙතෙක් අනුගමනය කළ ධර්මදූත ක්‍රමවේදයේ රැඩිකල් වෙනසක් සියලුම කිතුනු ආගමික සභාවන් විගසින් කළ යුතු බව අවධාරණය කරමින්ය. **ආගමට හරවා ගැනීම** පිළිබඳ ඓතිහාසික නාසරතයේ ජේසු තුමන් විසින්ම පවසන ලද මතෙව් 23:15 වගන්තිය මෙම රැඩිකල් වෙනස සඳහා ආලෝකයක් වන්නේය. යටත් විජිත යුගයේ සිට අද දක්වාම කිතුනු ධර්මදූතවරු අනුසාර කරන **ධර්මදූත බලය පැවරීමේ** ශුභාරංචි පුවත (මතෙව් 28:19) යොදා ගනිමින්, **අනෙකාගේ** ආගමික අනන්‍යතාවට ගරු නොකරමින්, ඔහු හෝ ඇයව කුමන තත්ත්වයක් මත හෝ ආගමට හරවා ගන්නේ නම්, එනම් **ස්ව** බවට පත් කිරීමට කටයුතු කරන්නේ නම්, එය ක්‍රිස්තු විරෝධීය. අවිහිංසාවාදයේ පියා වූ මහත්මා ගාන්ධි බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ කිතුනු ධර්මදූතවරුන්ට පැවසුවේ "ඔබ දිළින්දන්ගේ අධ්‍යාපනය, සුව සේවාව, සහ අනෙකුත් මානුෂීය ක්‍රියාකාරකම්වලින් අන්‍යාගමික ඉන්දියානුවන්ව ආගමට හරවා ගැනීමට හෙවත් ලබ්ධි ග්‍රහණයට (proselytizing) කටයුතු කරන්නේ නම්, මම ඔබට පවසන්නේ අදම ඉන්දීය භූමියෙන් ඉවත් වන ලෙසයි. සෑම රටක්ම අන් රටවල් මෙන් තමන්ගේ රටේ ලබ්ධිය නිසැකවම අභිමානයෙන් සලකන්නේය. ඉන්දියාවේ තිබෙන ඉතා ඉපැරණි මෙන්ම අභිමානවත් ආගම් ඉන්දියානුවන්ට සැබවින්ම ප්‍රමාණවත්ය. එක් ආගමකින් තවත් ආගමකට සංවර්තනය වීමට ඉන්දියානුවන්ට කිසිදු අවශ්‍යතාවක් නොමැත යන ස්ථාවරයේ අපි පිහිටමු" කියාය. [M.K. Gandhi, "Foreign Missionaries" *Young India*, April 23, 1931, p. 83].

## නිගමනය

ලාංකේය ක්‍රිස්තියානියේ අධිරාජ්‍ය ගැති අනන්‍යතාව පන්සිය වසරක් පැරණි වන හෙයින් ඉන් මුළු මනින්ම ඉවත් වීමට නම් සැබෑ අන්තර් ආගමික සංවාදයක් උදෙසා වන ධර්මදූත ප්‍රතිපදාවක් මෙරට කිතුනු සභාවන් විසින් අවංකවම ප්‍රකාශ කළ යුතුය. දේශානුරූපිකරණයෙන් පමණක් එම අරමුණ වෙත යා නොහැකි බව දැන් ඉතා පැහැදිළිය. මෙරට කතෝලික සභාවේ නිල නායකත්වය සැබෑ අන්තර් ආගමික සංවාදයක් සඳහා පෙනී සිටියේ නම් එහිලා සඳහන් කළ හැකි වන්නේ එක් පුද්ගලයෙක් පමණි. එනම් ලියෝ නානයක්කාර රදගුරුතුමාය. (පිටු 216-217, 355). මෙරට ප්‍රගතිශීලි දේවධර්මාචාර්යවරුන්ගෙන් ඉගෙනීමට එතුමා බැහැපත්වූ හෙයින් එවන් දැක්මක ස්ථාවරව පිහිටා සිටින්නට ඔහුට හැකි විය. මෙරට අන් කිතුනු සභා නායකයන් ලියෝ නානයක්කාර රදගුරුතුමාව අනුගමනය කළද වර්තමාන කතෝලික නායකත්වයට එවන් අවශ්‍යතාවක් තිබේද යන්න ඔවුන්ගේ ක්‍රියාවෙන් අපට සාක්ෂාත් නොවේ.

2009 වසරේදී කොටි සංවිධානය යුද්ධමය ලෙස පරාජය කොට වසර තිහක සිවිල් යුද්ධය ජය ගැනීමත් සමග මෙරට සිංහල කතෝලිකයන්ගේ සිංහල ජාතිකත්වය ප්‍රමුඛත්වයට පත්වීම වර්තමානයේ අප දුටුවද, 1992 වසරේ කළ විද්වත් පර්යේෂකයෙක් උපුටා දක්වමින් කතුවරයා පවසන්නේ මෙරට සිංහල කතෝලිකයන් තමන් පළමුව සිංහල ලෙසත් දෙවනුව කතෝලික ලෙසත් හඳුනාගැනීමට යොමු වෙමින් පවතින බවයි. (පිටු 291-292). දෙමළ කතෝලිකයන්ද තමන්ගේ දෙමළ ජාතිකත්වයට ප්‍රමුඛත්වය දීමේ ප්‍රවනතාව සිවිල් යුද්ධයට පෙර හා පසුව වන සිද්ධීන් මගින් පැහැදිළිවේ. සිංහල හා දෙමළ සමගියට පාලමක් විය හැකි මෙරට කිතුනුවන් මෙසේ ජාතිකත්වට මුල් තැන දීම නිසා අන්තර් ආගමික සංවාදය මෙන්ම ජාතින් අතර සමගිය

වෙනුවෙන් කළ යුතු බොහෝ දේ මඟහැරී තිබේ. කිතු දහමේ ප්‍රාරම්භකයාණන් වන නාසරතයේ ජේසුතුමාගේ ශුභාරංචියට අනුව ජාතිය, කුලය, ආගම, පංතිය හා සංස්කෘතිය යන සියල්ල අතික්‍රමණය කරන්නේ මිනිසත් බවයි. එතුමන්ගේ සැබෑ ශුභාරංචි පුවත මෙරට මුල්ඇද නොගත්තේ අධිරාජ්‍යයන්ගේ ක්‍රිස්තියානිය ධර්මදූතවරු මඟින් ප්‍රචලිත වූ හෙයිනි. මෙම පසුබිම මත මෙරට කිතුනු පාලකයන්ගේ අතීත ක්‍රියාවන් නිසා සිංහල බෞද්ධ ජනතාවට තිබෙන සැකයේ, පාවාදීමේ හා වෛරයේ ස්මරණයන් සුව කිරීමට තවත් වසර ගණනාවක සමාධානයේ ක්‍රියාවන් අවශ්‍යවනු ඇත. ("Many years of reconciliation work may be required to heal those memories of suspicion' betrayal and hate." p. 193).

***Faithing The Native Soil: dilemmas and aspirations of post-colonial Buddhists and Christians in Sri Lanka*,** නමැති මෙම කෘතිය පිටු 396 කින් යුක්තය. පරිශීලනය කළ කෘති මගින් උපුටා ගත් සටහන් හා කතුවරයාගේ විචාර (Notes) පිටු සියයකට ආසන්නය. ආශ්‍රිත ග්‍රන්ථ පිළිබඳ නාම ලේඛනයකින් (Bibliography) සහ පාරිභාෂිතයකින් (Glossary) සමන්විත වු මෙම කෘතියේ ආකාරාදි ලේඛනය හෙවත් සුචිය ද (Index) අඩංගු වූයේ නම් පරිශීලනයේ දී පාඨකයාට වඩාත් පහසු වේ.

**විජිත් රොහාන්**